**ශ්‍රී ලංකා කාය වර්ධන හා යෝග්‍යතා සම්මේලනය - 2021**

**----------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

----------------

### 1.1. මතය ව්‍යාවනය

----------------

ශ්‍රී ලංකා කාය වර්ධන හා යෝග්‍යතා සම්මේලනයේ ("සම්මේලනය") 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ප්‍රකාශය, අරමුදල් ගලායාමේ ප්‍රකාශනය සහ ෙමූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මෙම විගණනය සිදුකිරීම සඳහා පොදු පරිචයේ යෙදෙන වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයක් විසින් මට සහාය වන ලදී.

සම්මේලනයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි. මෙම වාර්තාවේ 1.5 ඡේදයේ විස්තර කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

### 1.2. මතය ව්‍යාවනය සඳහා පදනම

---------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය ව්‍යාවනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ විගණන විෂය පථය යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.

### 1.3. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

-----------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන සුළු හා මධ්‍ය පරිමාණ ආයතන සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සම්මේලනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සම්මේලනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සම්මේලනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සම්මේලනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සම්මේලනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4. විගණන විෂය පථය

---------------------

මාගේ වගකීම වන්නේ ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලව සම්මේලනයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණනයක් සිදුකර වාර්තාවක් නිකුත් කිරීමයි. කෙසේ වෙතත්, මතය ප්‍රකාශනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවල බලපෑම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ඉදිරිපත් කිරීම සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ විගණන නිරීක්ෂණ

--------------------------------------------------------

### 1.5.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

------------------------------------

| | අයිතමය | වටිනාකම | සාක්ෂි නොවීම | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | | රු. | | | |
| (අ) | පොදු ලෙජරය හා මුදල් පොත | - | සම්මේලනය විසින් පොදු ලෙජරය හා මුදල් පොත සකස් කර නොතිබුණි. | සම්මේලනයේ අදහස් දක්වා නොමැත. | පොදු ලෙජරය හා මුදල් පොත විගණනය වෙත ලබාදිය යුතුය. |
| (ආ) | ලියාපදිංචි ගාස්තු, වාර්ෂික ගාස්තු, ඇතුළතවීමේ ගාස්තු | 589,000 | ලදුපත් පොත | සම්මේලනයේ අදහස් දක්වා නොමැත. | ආදායම් පැවැත්ම තහවුරු කරගැනීම සඳහා ප්‍රමාණවත් ලේඛන විගණනය වෙත සැපයිය යුතුය. |
| (ඇ) | මුදල් හා බැංකු ශේෂ | 190,895 | බැංකු තහවුරු කිරීම් හා ස්වාධීන තහවුරු කිරීම් | සම්මේලනයේ අදහස් දක්වා නොමැත. | බැංකු හා මුදල් ශේෂ තහවුරු කරගැනීම සඳහා ස්වාධීන තහවුරු කිරීම් විගණනය වෙත සැපයිය යුතුය. |
| (ඈ) | ලැබිය යුතු දෑ | 2,192,600 | සාමාජික හා ශාලා ගාස්තු | සම්මේලනයේ අදහස් දක්වා නොමැත. | වත්කම්වල පැවැත්ම තහවුරු කරගැනීම සඳහා ස්වාධීන තහවුරු කිරීම් විගණනය වෙත සැපයිය යුතුය. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

**-----------------**

**2.1** **මූල්‍ය ප්‍රතිඵල**

-------------

සමාලෝචිත වර්ෂයේ සම්මලෙනයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 36,937ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 2,500ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 34,437 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මුළු වියදම රු. 552,063කින් වැඩිවීමට වඩා මුළු ආදායම රු. 586,500 කින් වැඩිවීම මෙම වර්ධනය සඳහා හේතු වී තිබුණි.